# විශේෂ දැනුම්දීමයි

## <u>කොරෝනා වෛරසය ඉතාලිය තුළ පැතිරයාම</u>

කොරෝනා වෛරසය ඉතාලිය තුළ සීඝ්‍ර ලෙස ව්‍යාප්ත වෙමින් පවතින බැවින් ඉතාලි රජය විසින් ඉතාලියේ සෑම ප්‍රදේශයක්ම නිරෝධායනයට ලක් කර ඇත. මේ තත්වය සැලකිල්ලට ගෙන පහත කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමුකොට ඔබගේ ආරක්ෂාව සඳහා කටයුතු කරන මෙන් මෙයින් දැනුම් දෙන්නෙමු.

- ඉතාලියේ සියළුම කලාප අවධානම් කලාප ලෙස නම් කර ඇති බැවින් ඉතාලිය තුළ ජීවත්වන සියළුම ජන කොටස් ප්‍රසිද්ධ ස්ථාන වල ඒකරාශී වීම තහනම් කර ඇත. මෙම තත්වය අප්‍රේල් මස 03 දක්වා බල පැවැත් වේ.

- ඉතාලිය තුළ කලාප හා නගර අතර ගමනා ගමනය සම්පූර්ණයෙන්ම තහනම් කර ඇති බැවින් තමන් සිටින ප්‍රදේශයෙන් බැහැර වීමට අවසර නොලැබේ.

- ඉතා හදිසි සහ අත්‍යාවශ්‍ය කටයුත්තක් මත ඔබට වෙනත් ප්‍රදේශයකට යාමට සිදුව ඇත්නම් ඒ සඳහා ඔබ විසින් මේ සමඟ අමුණා ඇති ආකෘති පත්‍රය පුරවා අදාල ඉතාලි ආරක්ෂක අංශ වෙත ඉදිරිපත් කොට අවසර ලබා ගත යුතුය.

- ශරීර උෂ්ණත්වය සෙල්සියස් 37.5 ට වඩා වැඩිනම් අනිවාර්යයෙන්ම නිවස තුළ රැඳී සිටිමින් වෛද්‍ය උපදෙස් මත කටයුතු කළයුතු අතර සෑම විටම ඉතාලි රජය මඟින් නිකුත් කරනු ලබන සෞඛ්‍ය උපදෙස් පිළිබඳව අවදානයෙන් සිට ඒවා පිළිපැදීමට කටයුතු කලයුතුය.

- ඉතා හදිසි කටයුත්තක් සඳහා ඔබ ඉතාලියෙන් පිටතට යාමට අදහස් කරන්නේනම් අදාල ආකෘති පත්‍රය(පිටපත් දෙකක්) පුරවා ඉතාලි බලධාරීන්ගේ අවසරය අනිවාර්යයෙන්ම ලබා ගත යුතු අතර එම අවසරය සමඟ අදාළ ගුවන් සේවය සහ ගුවන්තොටුපොළේ බලධාරීන් සමග සම්බන්ධ වෙමින් ඔවුන්ගේ උපදෙස් ලබා ගෙන කටයුතු සැලසුම් කර ගත යුතුය.

- ඉතාලියේ සිට ශ්‍රී ලංකාවට පැමිණෙන සියළුම මගීන් නිරෝධායන මධ්‍යස්ථාන වලට යොමුකොට දින 14 ක ආයතනික නිරෝධාන ක්‍රියාවලියකට ලක් කරනු ලබයි. එහිදී ඔබගේ සියළුම ගමන් මලුද නිරෝධායන මධ්‍යස්ථාන වලට යොමු කරනු ලබන අතර නිරෝධන ක්‍රියාවලිය අවසානයේ ගමන් මලු නැවත හිමිකරුවන් වෙත ලබා දේ. නිරෝධායන මධ්‍යස්ථාන වෙත යාමට පෙර ඔබ රැගෙන යන මුදල් බැංකු ගත කිරීම සඳහා ගුවන් තොටුපළේ පහසුකම් සලසා ඇත.

තානාපති කාර්යාලය හා මිලාන් කොන්සියුලර් ජෙනරාල් කාර්යාලය තවදුරටත් විවෘතව පවතින අතර ඔබට අවශ්‍ය කොන්සියුලර් තොරතුරු සඳහා පහත නිලධාරීන් ඇමතීමෙන් අවශ්‍ය විස්තර ලබා ගත හැක.

<u>ශ්‍රී ලංකා තානාපති කාර්යාලය</u>

| | |
|---|---|
| ප්‍රියා නාගරාජා මෙනවිය, තෙවන ලේකම් | - (0039) 3 403 581 603 |
| ඒ. පුෂ්පරාජ් මහතා, පරිවාර නිලධාරී - | (0039) 3 459 935 732 |
| මාධව වික්‍රම මහතා, කොන්සියුලර් අංශය | - (0039) 3 499 352 624 |
| නිමාලි ජයමහ මෙනවිය, කොන්සියුලර් අංශය | - (0039) 3 483 027 997 |
| චමින්ද ධර්මරත්න මහතා, කොන්සියුලර් අංශය | - (0039) 3 483 028 427 |

<u>මිලාන් කොන්සියුලර් ජෙනරාල් කාර්යාලය</u>

| | |
|---|---|
| සඳමාලි දිසානායක මහත්මිය, පරිවාර නිලධාරිණී - | (0039) 3 888 016 268 |
| චතුරිකා රෝෂණී මහත්මිය, කොන්සියුලර් අංශය - | (0039) 3 887 249 016 |

**2020.03.10**